**කොටපොළ ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කොටපොළ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොටපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.4,533,758 ක් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගෙන් අදාල තහවුරුව ලද පසු ප්‍රතිපාදන වෙන්කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු. 8,774,750 ක මුද්දර ගාස්තු හා උසාවි දඩ ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාව විසින් බැංකුවේ පවත්වාගෙන ගොස් තිබූ ස්ථාවර තැන්පත් ගිණුම් 04 කට අදාළ ලැබිය යුතු රු.495,478 ක පොලිය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී වසා දමන ලද ස්ථාවර තැන්පත් ගිණුම් දෙකකට හා ආරම්භ කර කල් පිරුණු ස්ථාවර තැන්පත් ගිණුම් 03 කට අදාලව ලැබී තිබූ පොලී ආදායම රු.201,389 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 134 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.1,047,000 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගත් විට රු.750 ක දඩ පමණක් අයකරන නිසා ගිණුම්ගත නොකළ බව. | නිවැරදිව ගිණුම්ගත කර අය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.538,427 ක් වූ විවිධ වියදම් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (උ) | ඉකුත් හා සමාලෝචිත වර්ෂයේදී සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි සංවර්ධනය කිරීමේ රු.3,689,168 ක් වූ නිමි වැඩ වටිනාකම ඉඩම් හා ගොඩනැඟිලි යටතේ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඌ) | නිශ්චිත හඳුනා ගැනීමකින් තොරව රු.3,000,000 ක් කර්මාන්ත ණයහිමියන් යටතේ ප්‍රතිපාදන වෙන් කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.6.2 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දීර්ඝ කාලයක් තිස්සේ ඉදිරියට එමින් පවතින අවිනිශ්චිත ගිණුමෙහි තවදුරටත් ඉදිරියට එමින් පවතින රු.64,848 ක හර ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය,විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථන යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 43,992,266 ක් වූ ගිණුම් විෂයයන් 14 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නිති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 103 (i) | සභාව සතු කැබ් රථයට 2022 ඔක්තෝබර් 12 දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අනතුර සම්බන්ධයෙන් මු.රෙ.103(I) අලාභ හානි පිළිබඳව කටයුතු නිසි පරිදි සිදු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.5,833,966 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 4,599,518 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,113,000 | 1,742,876 | 1,893,544 | 1,045,645 | 2,145,000 | 1,472,808 | 1,377,480 | 1,196,313 |
| (ii) | කුලී | 6,610,000 | 4,613,649 | 4,888,161 | 1,266,888 | 8,280,000 | 3,318,152 | 3,064,362 | 1,541,400 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,837,000 | 298,247 | 298,247 | - | 1,412,000 | 133,450 | 133,450 | - |
| (iv) | වෙනත් ආදායම් | 13,947,000 | 4,122,398 | 4,087,785 | 2,391,823 | 12,358,500 | 8,059,795 | 7,393,557 | 2,357,210 |
| | එකතුව | 25,507,000 | 10,777,170 | 11,167,737 | 4,704,356 | 24,195,500 | 12,984,205 | 11,968,849 | 5,094,923 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ අදායම් රැස් කිරීමේ කාර්යයසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1946 අංක 30 දරන තක්සේරු පනතේ 20 වගන්තිය ප්‍රකාරව වරිපනම් දේපළ වසර 05 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අයකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී, 2005 වර්ෂයේ සිදුකළ දේපළ තක්සේරු වටිනාකම මත වරිපනම් ඒකක 701කින් බදු අය කරමින් පැවතුණි. | 2023 වර්ෂයේදී 2020 තක්සේරු වාර්තාව මත පදනම් ව වරිපනම් අය කිරීමට කටයුතු කළ අතර, මේ වන විට නව තක්සේරු වාර්තාව අනුව වරිපනම් ගාස්තු සංශෝධනය කර අය කරන බව. | නිවැරදි තක්සේරු වටිනාකම මත බදු අය කළ යුතු වේ. |
| (ආ) | 2011 දෙසැම්බර් 09 දින ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ දියුණු කළ ප්‍රදේශවලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් වරිපනම් බදු අය කර නොතිබුණි. | 2022 වර්ෂය තුළදී දියුණු කළ ප්‍රදේශ ලෙස කොටපොල උතුර හා කොටපොල දකුණ ග්‍රාම සේවා වසම් හදුනාගෙන එය සිතියම්ගත කොට ගැසට් කිරීම සඳහා 2023 සහකාර කොමසාරිස්තුමා වෙත යවා ඇති බවත්, ඒ අනුව වරිපනම් බදු අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | සභාව විසින් දියුණු කළ ප්‍රදේශවල වරිපනම් බදු පනවා අයකර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර ගණනාවක් තිස්සේ ඉදිරියට එමින් පැවති රු. 419,132 ක් වූ හිඟ විනෝද බදු ආදායම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගෙන් උපදෙස් ඉල්ලා ඇතත් මේ වන තෙක් උපදෙස් ලැබී නොමැති බව . | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට කඩ කාමර 15 කින් රු.252,172 ක හිඟ ශේෂයක් පැවතුණු අතර, කඩ කාමර 10 කට අදාළව රු.6,000 ට වැඩි හිඟ ශේෂ පැවතුණි. | හිඟ අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඊ) | දෙනියාය බස් නැවතුම්පොළ ඉදිරිපිට වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 21 කට අදාළව බදු කුලිය තක්සේරු කර නොතිබූ අතර, කොටපොළ ජාතික පාසල ඉදිරිපිට කඩකාමර 03 කට අදාළව කඩ කාමර බදු දීමේදී අය කළ යුතු එක්වන් මුදල වූ රු.950,000 න් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගෙන නොතිබුණි. | ඉදිරියේදී නව තක්සේරුවක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. හා හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව. | කඩ කාමර තක්සේරු කළයුතු අතර, හිඟ මුදල් කඩිනමින් අය කළයුතුය. |
| (උ) | වර්ෂය අවසානයට පැවති රු.1,266,888 ක බදු කුලී හිඟයෙහි වර්ෂ 01 ඉක්ම වූ හිඟ හිටි පොල මාළු වෙළෙඳසැල් බදු රු. 966,716 ක් පැවති අතර ඉන් හිඟ හිටි කාලසීමාව වර්ෂ 03 ට වැඩි හිඟ ශේෂය රු.687,651 ක් විය. | හිඟ ශේෂය අය කර ගැනීම සඳහා අධිකරණයේ නඩු පවරා ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඌ) | ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කොටපොළ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හෝටල්, අපනශාලා හා නවාතැන්පොළ 09 කින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව ගාස්තු අයකර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට 1% නොඉක්මවන බලපත්‍ර ගාස්තු අය කිරීමට පියවර ගන්නා බව. | අය නොවන ආදායම් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 උප වගන්තිය ප්‍රකාර නාගරික නොවන බල ප්‍රදේශය තුල ගොඩනැඟිලි සැලසුම් අනුමත කිරීම, ඉඩම් අනුබෙදුම් කිරීම සම්බන්ධ කටයුතු හා ශ්‍රවණාගාරය කුලියට දීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | නාගරික නොවන ප්‍රදේශ සඳහා අදාළ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත අනුමැතිය සඳහා මාතර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කර ඇති බව. | අතුරු ව්‍යවස්ථා කඩිනමින් සකස් කළ යුතු වේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් නාගරික බල ප්‍රදේශය තුළ අළුතින් ඉදිකර තිබූ හා ඉදිකරමින් පැවති වාණිජ හා වාණිජ නොවන ගොඩනැගිලි 03 ක් හා මායිම් තාප්ප 01 ක් සම්බන්ධයෙන් සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගැනීමට හෝ විධිමත් කිරීමේ හැකියාවක් පවතින්නේ නම් එම ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනයේ සඳහන් පරිදි රු.1,084,790 ක ගාස්තු අයකර විධිමත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපි ගොනු කඩිනමින් ඉදිරිපත් කරන ලෙස අදාළ පාර්ශවය දැනුවත් කරන ලද බව. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වේ. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දකුණු පළාතේ පළාත් පාලන ආයතන බලප්‍රදේශවල පිහිටි ක්‍රීඩා භූමි සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ මාර/ පල්ලේගම මහා විද්‍යාලයේ වොලිබෝල් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී වැරදි රේටයන් භාවිතා කර රු.232,543 ක් වැඩිපුර ගෙවා තිබූ අතර කොහුබත් ස්ථරය සඳහා මිල විශ්ලේෂණයකින් තොරව රු.114,642 ක් ගෙවා තිබුණි. | දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලයේ මිල රේටයන් භාවිතා කළ බව. | නියමිත රේටයන් භාවිතා කර ගෙවීම් කළ යුතු වේ. |
| (ආ) | පළාත් සභා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන යටතේ දෙනියාය සති පොළෙහි ඉතිරි වැඩ නිම කිරීමේ කර්මාන්තයට අදාලව රු. 4,033,233 ක නිම් වැඩ ඉටු කර ඉදිකිරීම් අතර මඟ නතර කර තිබුණි. ඉදිකරන ලද කොටස් ස්වාභාවික හේතු මත විනාශ වෙමින් පැවති අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | ඇස්තුමේන්තුව සකස්කර අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇති බවත් 2023 වර්ෂය අවසන් වීමට පෙර අදාල ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කිරිමට කටයුතු කරන බව. | ව්‍යාපෘතියේ වැඩ කඩිනමින් අවසන් කිරිමට කටයුතු කළ යුතු වේ. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කරන වැඩ/ ක්ෂේත්‍ර කම්කරුවන් 12 දෙනෙකු, සෞඛ්‍ය කම්කරුවකු, ජල සහායකයෙකු සහ ආදාහනාගාර ක්‍රියාකරුවකු වෙත තනතුරට අදාළ නියමිත රාජකාරි පවරා නොතිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා වශයෙන් සභා අරමුදලින් රු.7,248,347 ක් වැය කර තිබුණි. | සුදුසුකම්, සේවා අවශ්‍යතාවය,වෛද්‍ය හේතු වැනි සාධක මත පදනම්ව රාජකාරි පවරා ඇති බව. | තනතුරට අදාළ රාජකාරි පැවරිය යුතු වේ. |